# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2295/21 – 2022 සැප්තැම්බර් 01 වැනි බ්‍රහස්පතින්දා – 2022.09.01**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2021/26.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශ්වයක් වශයෙන්,*
එච්. පී. යූ. කේ. ද සිල්වා මයා, අංක. 396/32, ගාලු පාර, කල්පිටිය දකුණ, වාද්දුව.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*
කොමුති ඉංජිනියරින් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක. 595, නාවල පාර, රාජගිරිය.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කොළඹ 06, රාජසිංහ පාර, අංක 56, නීතිඥ තම්බයියා පලනිවේලු පරමේස්වරන් මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

මනූෂ නානායක්කාර,
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 අගෝස්තු මස 25 වැනි දින,
කොළඹ දී ය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/02/2021/26.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*
එච්. පී. යූ. කේ. ද සිල්වා මයා, අංක. 396/32, ගාලු පාර, කල්පිටිය දකුණ, වාද්දුව.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*
කොමුති ඉංජිනියරින් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක. 595, නාවල පාර, රාජගිරිය.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''කොමුති ඉංජිනියරින් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් එහි සේවක එච්. පී. යූ. කේ. ද සිල්වා මහතාට මසකට දින 26/27 සම්පූර්ණ කළ විට ගෙවීමට එකඟව ඇති පැමිණීමේ දීමනාව හා ගමන් වියදම් දිරි දීමනාව 2019 ජනවාරි, අප්‍රේල් හා මැයි මාසයන් සඳහා ලබානොදීමෙන් ආසාධාරණයක් සිදුව තිබේ ද? යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේ ද? යන්න පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 අගෝස්තු මස 24 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 09 – 0005

---

මගේ අංකය: IR/COM/02/2020/62.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශවයක් වශයෙන්,*
එච්. කේ. ආර්. එන්. ඉන්ද්‍රජිත් මයා, අංක. 120/6, ''සම්පත්'', ඇල්දෙනිය, ගැටමාන්න, බෙලිඅත්ත.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*
ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හොටෙල්, හොටෙල්ස් කලම්බු (1963) ලිමිටඩ්, අංක. 02, යෝර්ක් වීදිය, කොළඹ 01.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී

ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බණ්ඩාරවෙල, කොළතැන්න, හිල්ඔය පාර, රික්ටන්, රවීන්ද්‍ර ලාල් ගුණවර්ධන මයා, පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 අගෝස්තු මස 29 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2020/62.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*
එච්. කේ. ආර්. එන්. ඉන්ද්‍රජිත් මයා, අංක. 120/6, ''සම්පත්'', ඇල්දෙනිය, ගැටමාන්න, බෙලිඅත්ත.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*
ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හොටෙල්, හොටෙල්ස් කලම්බු (1963) ලිමිටඩ්, අංක. 02, යෝර්ක් වීදිය, කොළඹ 01.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''එච්. කේ. ආර්. එන්. ඉන්ද්‍රජිත් මහතාගේ වැඩ තහනම් කරන ලද 2017.05.30 වැනි දින සිට නැවත රැකියාව ලබා දුන් 2017.11.06 වැනි දින දක්වා කාලයට අදාළ වැටුප නොගෙවීම තුළින් ඒ මහතාට ආසාධාරණයක් සිදුව තිබේ ද? තිබේ නම් ලැබිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 අගෝස්තු මස 23 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 09 – 0006

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.